තම පියා නොවන (බව දැන සිටියදී ඔහු නොවන) කෙනෙකුට (ඔහුගේ පීතෘත්තවය සම්බන්ධයෙන්) වාද කරන මිනිසා දේවත්වය ප්රතික්ෂේප කළ අයකු මිස නැත. තමන්ට අයිති නොමැති දෙයක් සම්බන්ධයෙන් කවරෙකු වාද කළේ ද ඔහු අප අතරින් කෙනෙකු නොවන්නේය. අපා ගින්නෙන් යුත් ඔහුගේ නවාතැන ඔහු වෙන් කර ගනිත්වා! කවරෙකු මිනිසෙකුට දේව ප්රතික්ෂේපය සම්බන්ධ කරමින් වාද කළේ නම් හෝ අල්ලාහ්ගේ සතුරා යැයි පවසා සිටියේ නම් හෝ ඔහු ද එසේ නොවන තත්ත්වයේ සිටියදී (වාද කළ) ඔහු ඒ වෙතටම යොමු වනවා මිස නැත.

අබූ දර් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. “තම පියා නොවන (බව දැන සිටියදී ඔහු නොවන) කෙනෙකුට (ඔහුගේ පීතෘත්තවය සම්බන්ධයෙන්) වාද කරන මිනිසා
දේවත්වය ප්රතික්ෂේප කළ අයකු මිස නැත. තමන්ට අයිති නොමැති දෙයක් සම්බන්ධයෙන්
කවරෙකු වාද කළේ ද ඔහු අප අතරින් කෙනෙකු නොවන්නේය. අපා ගින්නෙන් යුත් ඔහුගේ
නවාතැන ඔහු වෙන් කර ගනිත්වා! කවරෙකු මිනිසෙකුට දේව ප්රතික්ෂේපය සම්බන්ධ කරමින්
වාද කළේ නම් හෝ අල්ලාහ්ගේ සතුරා යැයි පවසා සිටියේ නම් හෝ ඔහු ද එසේ නොවන තත්ත්වයේ සිටියදී (වාද කළ) ඔහු ඒ වෙතටම යොමු වනවා මිස නැත.”
[පූර්ව සාධක සහිත හදීසයකි] [බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

කරුණු තුනෙන් එකක් සිදු කරන තැනැත්තාට දැඩි අවවාදයක් හා බලවත් තරවටු මෙම හදීසයේ සඳහන්ව ඇත. එසේනම් මෙම ක්රියා තුනම එකට සිදු කරන්නාගේ තත්ත්වය කෙසේනම් වනු ඇත් ද? පළමුවැන්නා: තම පියා හොඳින් හඳුනන්නෙකු හා තම පරම්පරාව ගැන හොඳින් තහවුරු කරගත් අයකු ලෙස සිටියදී එය ඔහු හෙළා දැක නොදන්නා සේ හිද වෙනත් පියකු වෙත හෝ ඔහුගේ වෙනත් ගෝත්රයක් වෙත ඔහුගේ පරම්පරාව ඈඳමින් වාද කරන්නාය. දෙවැන්නා: තමන් දැනුවත්ව තමන්ට අයිති නැති පරම්පරාවක් හෝ වස්තුවක් හෝ වගකීම් අතරින් යම් වගකීමක් හෝ ක්රියාවන් අතරින් යම් ක්රියාවක් හෝ දැනුම් අතරින් යම් දැනුමක් හෝ තමන් සතු වූවක් බව වාද කරන්නේ ද එසේ නැතහොත් සූරා කෑ යම් ගුණාංගයක් ඔහු තුළ ඇති බව විශ්වාසය ඇති කරවා බොරු පවසමින් ජනයාට මුහුණ දී කටයුතු කරන්නේ ද ඔහුගේ දඬුවම බිහිසුණුය. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා එවැන්නන්ගෙන් ඉවත් වූහ. අපා ගින්නේ ස්ථානයක් තෝරා ගන්නා මෙන් එතුමා ඔහුට නියෝග කළේය. එය ඔහු එයට අදාළ පුද්ගලයකු වන බැවිණි. තැන්වැන්න: නිරපරාධියෙකු වෙත දේවත්වය ප්රතික්ෂේප කිරීම හෝ යුදෙව්වාදය හෝ කිතුනුවාදය හෝ සැබැවින්ම ඔහු අල්ලාහ්ගේ සතුරන් අතරින් කෙනෙකු යැයි හෝ ඈදා ඔහුට චෝදනා නැගීමය. මෙසේ පැවසීමෙන් ඔහු පැවසූ දෑ වෙත ඔහුම යොමු වනු ඇත. තම නපුරු ක්රියාවන් හා ප්රකාශයන් සම්බන්ධයෙන් අනවධානීව සිටින මුස්ලිම්වරයකුට වඩා මෙම අශීලාචාර ගුණාංග තුළින් ඔහු එයට වඩාත් සුදුස්සකු වන බැවිණි.